# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

**පෙරහැර අංකය :- ......................**

**49 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2023 – (2023 ඔක්තෝබර් මස 06, 07 සහ 08)**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 49 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2023 ඔක්තෝබර් මස 06, 07 සහ 08 යන දිනවල කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ.

මෙම උපාධි ප්‍රදානෝත්සවය සැසි 09 කින් යුක්ත වන අතර ඔබට නියමිත සැසිය පහත දැක්වේ.

පළමුවන සැසිය - 2023 ඔක්තෝබර් මස 06 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී උපාධිය, ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය, ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධියට අදාල උපාධිලාභීන් සඳහා

දෙවන සැසිය - 2023 ඔක්තෝබර් මස 06 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 1.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (ගෞරව), විද්‍යාවේදී ගෞරව තොරතුරු තාක්ෂණ උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

තෙවන සැසිය - 2023 ඔක්තෝබර් මස 06 වැනි දින ප.ව. 2.30 සිට ප.ව. 04.30 දක්වා

- තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණවේදි ගෞරව උපාධිය , ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

- ඉංජිනේරු පීඨයේ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

සිව්වන සැසිය - 2023 ඔක්තෝබර් මස 07 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ වාණිජවේදි (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

පස්වන සැසිය - 2023 ඔක්තෝබර් මස 07 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 01.00 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථිකවිද්‍යා) (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) උපාධිය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

හයවන සැසිය - 2023 ඔක්තෝබර් මස 07 වැනි දින ප.ව. 2.30 සිට ප.ව. 04.30 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

හත්වන සැසිය - **2023 ඔක්තෝබර් මස 08 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා**

වායවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී (ගෞරව) උපාධියට සහ විද්‍යාවේදී (ගෞරව) වායවහාරික විද්‍යා උපාධියට අයත් සියලුම උපාධිලාභීන් සහ

විද්‍යාවේදී සාමාන්‍ය උපාධියේ {දෙවන පෙල (ඉහළ), දෙවන පෙල (පහළ)} ශ්‍රේණි සඳහා අයත් සියලුම උපාධිලාභීන් සඳහා

අටවන සැසිය - **2023 ඔක්තෝබර් මස 08 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 01.00 දක්වා**

- වායවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියේ සාමාන්‍ය සාමර්ථ්‍යයට අයත් සියලුම උපාධිලාභීන් සඳහා

- වෛද්‍ය විද්‍යා පීඨයේ වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය, විද්‍යාවේදී මානව ජීව විද්‍යා උපාධිය, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව උපාධිය, විද්‍යාවේදී හෙද ගෞරව උපාධිය, ඖෂධවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

නවවන සැසිය - **2023 ඔක්තෝබර් මස 08 වැනි දින ප.ව.02.30 සිට ප.ව.04.30 දක්වා** පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දර්ශනසූරි, දර්ශනපති, දර්ශනපති ව්‍යාපාර ආර්ථික විද්‍යාව, ශාස්ත්‍රපති, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, කළමනාකරණ විද්‍යාපති, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති, දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාපති, පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ විද්‍යාපති, මත්ස්‍ය හා ජලජීවී සම්පත් කළමනාකරණ පිළිබඳ විද්‍යාපති, වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණ පිළිබඳ විද්‍යාපති, වායවහාරික මූල්‍ය විද්‍යාපති, වායවහාරික සංඛ්‍යාන විද්‍යාපති, ව්‍යාපාර පරිපාලන විද්‍යාපති, රාජ්‍ය කළමනාකරණපති, රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණ විද්‍යාපති, වායවහාරික සංඛ්‍යාන විද්‍යා පශ්චාද් උපාධිය, ව්‍යවසායකත්වපති, වෘත්තීය ගිණුම්කරණ පශ්චාද් උපාධිය, ව්‍යාපාර ආර්ථික විද්‍යාපති, සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය, අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, අලෙවි කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කාර්මික ගණිතය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දේපල කලමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, මත්ස්‍ය හා ජලජීවී සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය පිළිබඳ උපාධි අභිඥාන පත්‍රය, වායවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, වායවහාරික සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රය සහ වායවහාරික සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රයට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

## 1. <u>උපාධිලෝගු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:</u>

2023 සැප්තැම්බර් 23 (සෙනසුරාදා) සහ සැප්තැම්බර් 24 (ඉරිදා) යන දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා සහ පස්වරු 1.00 සිට පස්වරු 4.00 දක්වා <u>ඔබට අදාළ පීඨයේදී</u> උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම, සාටකය සහ ප්‍රවේශ පත්‍ර ඔබ වෙත නිකුත් කරනු ලැබේ.

- උපාධි ලෝගුව, සාටකය සහ හිස්වැස්ම සමඟ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා රු.5,000/= තැන්පතු මුදල ගෙවන ලද අදාළ කුවිතාන්සිය (බැංකු රිසිට්පත/මාර්ගගත ගෙවුම් ලදුපත), ශිෂ්‍ය වාර්තා පොත සහ මෙම ලිපිය පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. <u>ශිෂ්‍ය හැඳුනුම්පත මෙතෙක් බාරදී නොමැති නම් එය මෙම අවස්ථාවේ දී පීඨ කාර්යාලයට බාර දිය යුතුය</u>.

අදාළ ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ශිෂ්‍ය ගෙවීම් පද්ධතිය වෙත පිවිස එහි ඇති ඔබට අදාළ ගිණුම් අංකය සහිත ආදර්ශ රිසිට් පත බාගත කරගෙන ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම් කළ හැකිය. ඊට අමතරව ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් අන්තර්ජාලය හරහා ද ගෙවීම් කළ හැකිය. එසේ ගෙවීම් කර බාගත කර ගන්නා ලද මුදල් ගෙවීම් කුවිතාන්සිය 2023 සැප්තැම්බර් මස 15 දිනට පෙර සූදානම් කරගත යුතුය. ඔබට උපාධිලෝගු ලබා ගැනීමේ දී ඇතිවන අපහසුතා මඟ හරවා ගැනීම සඳහා ඉහත දිනට පෙර ගෙවීම් කරන්න.

පහත සඳහන් ආකාරයට විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස ගෙවීම් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

www.sjp.ac.lk ➡ Students ➡ Student Payments ➡ Internal Student ➡ Enter Your NIC Number & Select Faculty ➡ Select **'Refundable Cloak Fee'**

තවද විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පලකර ඇති පහත සඳහන් අයදුම්පත් දෙක (02) සම්පූර්ණ කර <u>උපාධි ලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී පීඨ කාර්යාලය වෙත අනිවාර්යයෙන්ම බාර දිය යුතු වේ.</u>

1. උපාධි ලෝගු ගාස්තු නැවත ගෙවීමේ අයදුම්පත (ඇමුණුම i)
2. උපාධිලාභීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ ප්‍රශ්නාවලිය **(Google Form)**
   **(link in the description)**

එලෙසම උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකය භාවිතා කිරීම සඳහා වන ආචාරධර්ම උපාධිලාභියා විසින් අනිවාර්යෙන්ම පිළිපැදිය යුතු වන අතර එම ආචාරධර්ම විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පල කරනු ලැබේ. එය කියවා හොඳින් තේරුම් ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

තවද කිසිදු හේතුවක් නිසා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දින තුළ උපාධි ලෝගු හා හිස්වැසුම් නිකුත් කරනු නොලැබේ. උපාධි ලෝගුව, හිස්වැසුම නොමැතිව කිසිදු ගිහි උපාධිලාභියකුට උපාධි පෙරහැරට සහභාගී විය නොහැකිය. උපාධිලාභී භික්ෂූන් වහන්සේලා සඳහා විජිනිපත් එදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ලබා ගත හැකිය.

## 2. <u>උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය ආපසු බාරදීම:</u>

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය ඔබගේ උපාධි ප්‍රදානෝත්සවය අවසානයේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටවනු ලබන විශේෂ කවුන්ටරය වෙත භාර දිය යුතුය. <u>යම් හෙයකින් එලෙස බාරදිය නොහැකි වුවහොත් පහත සඳහන් දිනයන්හි දී පමණක් අදාළ පීඨ කාර්යාලයට පැමිණ උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාර දිය හැකි අතර</u> නියමිත දිනට පෙර උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය බාරදීමට අපොහොසත් වුවහොත් ප්‍රමාද වන දින අනුව දඩ මුදලක් ගෙවීමට සිදුවනු ඇත.

- <u>මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය</u>

**2023 ඔක්තෝබර් මස 13 (සිකුරාදා) , 2023 ඔක්තෝබර් මස 14 (සෙනසුරාදා)**

- <u>තාක්ෂණ පීඨය</u>

**2023 ඔක්තෝබර් මස 13 (සිකුරාදා) , 2023 ඔක්තෝබර් මස 15 (ඉරිදා)**

- <u>ඉංජිනේරු පීඨය</u>

**2023 ඔක්තෝබර් මස 14 (සෙනසුරාදා), 2023 ඔක්තෝබර් මස 15 (ඉරිදා)**

- <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය</u>

**2023 ඔක්තෝබර් මස 13 (සිකුරාදා), 2023 ඔක්තෝබර් මස 14 (සෙනසුරාදා),**

**2023 ඔක්තෝබර් මස 15 (ඉරිදා)**

- <u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>

**2023 ඔක්තෝබර් මස 14 (සෙනසුරාදා), 2023 ඔක්තෝබර් මස 15 (ඉරිදා)**

- <u>වෛද්‍ය විද්‍යා පීඨය</u>

**2023 ඔක්තෝබර් මස 14 (සෙනසුරාදා), 2023 ඔක්තෝබර් මස 15 (ඉරිදා)**

- <u>පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය</u>

**2023 ඔක්තෝබර් මස 14 (සෙනසුරාදා), 2023 ඔක්තෝබර් මස 15 (ඉරිදා)**

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාරදෙන අවස්ථාවේ දී උපාධි ලෝගුව සහ හිස්වැස්ම සඳහා ගෙවන ලද රු. 5000/= ක තැන්පත් මුදල ඔබ වෙත මුදලින් ගෙවීමට හෝ ඔබගේ ගිණුම් අංකයට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව ඔබ වෙත ලබා දුන් උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකයට කිසියම් අලාභ හානියක් වී ඇත්නම් හෝ එය අස්ථානගත වී ඇත්නම් එහි සම්පූර්ණ වටිනාකම ඔබට ගෙවීමට සිදුවේ.

3. **<u>ඇඳුම්:</u>**
කාන්තා උපාධිලාභීන් අභිමත වර්ණයක **<u>සාරි හෝ ඔසරිවලින්</u>** අනිවාර්යෙන්ම සැරසී සිටිය යුතු අතර පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

4. **<u>පැමිණීම:</u>**
උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ වීමට **<u>පැය එක හමාරකට පෙර</u>** බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ උපාධිලාභී පෙරහැර සඳහා සූදානම් විය යුතුය.

5. **<u>උපාධි පෙරහැරේ පෙළ ගැසීම:</u>**
ගිහි පැවිදි සියලුම උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුතු අතර, ගිහි උපාධිලාභීන් උපාධි ලෝගුව හා හිස්වැස්ම පැළඳ සිටීම අනිවාර්ය වේ. උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුත්තේ උපාධිලාභී නාමලේඛනයේ සඳහන් අනුපිළිවෙලට බැවින් ඔබට ලබා දී ඇති පෙරහැර අංකයේ පිළිවෙලට පෙළ ගැසිය යුතුය. **<u>උපාධි සාටකය පැළඳ ගැනීම සිදුකළ යුත්තේ උපාධිය පිරිනැමීම සඳහා ඔබ වේදිකාවට පිවිසෙන අවස්ථාවේදී පමණක් බව කරුණාවෙන් සලකන්න. ඉන් පසුව උපාධි ප්‍රදානෝත්සවය අවසන් වන තෙක් එය පැළඳ සිටිය යුතුය.</u>**

6. **<u>පෙරහැර අංකය පැළඳ සිටීම:</u>**
ඔබගේ උපාධි සහතිකය වෙනත් උපාධිලාභියකු වෙත නිකුත් වීම වැළැක්වීම සඳහා ඔබගේ පෙරහැර අංකය උපාධි ලෝගුවේ අලවනු ලැබේ. ඔබ ප්‍රධාන වේදිකාවට ප්‍රවිශ්ය වන අවස්ථාවේ දී එම පෙරහැර අංකය උපාධි සාටකයෙන් නොවැසෙන පරිදි තබා ගත යුතු අතර, එය ඉතා ප්‍රවේශමෙන් උපාධි ලෝගුවෙන් නොගැලවෙන සේ තබා ගැනීමට ඔබ විසින් වගබලා ගත යුතුය.

7. **<u>වේදිකාව තුළ දී උපාධි සහතිකය ලබා ගැනීම:</u>**
උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ කිරීමෙන් පසුව, උපාධි ලාභීන්ගේ නම් ප්‍රකාශ වන අනුපිළිවෙලට වේදිකාවට කැඳවා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ හෝ උපකුලපතිතුමා විසින් ඔබ වෙත උපාධිය ප්‍රදානය කරනු ලැබේ.

8. **ප්‍රවේශ පත්‍ර:**

උපාධිලාභියෙකුට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට ඇතුල්විය හැක්කේ නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කරන්නේ නම් පමණි. මේ සඳහා ඔබට එක් ප්‍රවේශ පත්‍රයක් ද, ඔබගේ දෙමව්පියන් හෝ වෙනත් අමුත්තන් සඳහා ප්‍රවේශ පත්‍ර දෙකක් ද නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශ පත්‍ර ද උපාධි ලෝගුව, සාටකය සහ හිස්වැස්ම සමඟ නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, වාහන ප්‍රවේශ පත්‍ර ද ඒ සමඟම නිකුත් කරනු ලැබේ. වයස අවුරුදු 18 ට අඩු කිසිම අයෙකුට මෙම ප්‍රවේශපත් වලින් ශාලාවට පිවිසීමට අවසර දෙනු නොලැබේ.

9. **උපාධි පිරිනැමීම නිමාව:**

එක් සැසියක් අවසානයේ සංග්‍රහයක් පැවැත්වෙන අතර, ඊට අදාළ අවසර පත්‍ර ඔබගේ ප්‍රවේශ පත්‍රය සමඟ ඇත. ඔබට නියමිත සැසිය අවසන් වූ වහාම ඊළඟ සැසිය සඳහා උපාධිලාභීන්ගේ පෙරහැර හා ආචාර්ය මණ්ඩලයේ පෙරහැර සංවිධානය කිරීමට කටයුතු කරනු ලබන බැවින් ඒ සඳහා බාධාවක් නොවන පරිදි ප්‍රධාන පරිශ්‍රයෙන් හා පෙරහැර පෙළ ගැසෙන ස්ථානයෙන් ඉවත් වී ඔබගේ සහයෝගය දක්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

10. **ඡායාරූප ලබා ගැනීම:**

ඡායාරූප ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය මගින් නිල ඡායාරූප ආයතනයක් තෝරා ගනු ලැබේ. විශ්වවිද්‍යාල නිල ලාංඡනය සහිතව ඡායාරූප නිකුත් කළ හැකි වනුයේ එම ආයතනයට පමණි. විශ්වවිද්‍යාලය මගින් අනුමත ඡායාරූපවල ප්‍රමාණයන් හා මිල ගණන් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් පසුව දැනුවත් කරනු ලැබේ. ඡායාරූප ලබා ගැනීම සඳහා අදාළ ආයතනය වෙත අත්තිකාරම් ගෙවීම උපාධි ලෝගුව ලබා ගන්නා අවස්ථාවේදී කළ හැකිය. ඡායාරූප ලබා ගැනීම සඳහා වැඩි විස්තර උපාධි ලෝගුව ලබා ගන්නා අවස්ථාවේදී අදාළ ආයතනයේ නියෝජිතයන්ගෙන් ලබාගත හැකිය.

11. උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලබා ගන්නා සියලුම උපාධිලාභීන්ගේ නාමලේඛන ඇතුලත් විශේෂ අතිරේකයක් **2023.10.01 (ඉරිදා)** දින **Sunday Observer** පුවත්පත සමඟ නිකුත් කරනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ලේඛකාධිකාරී වෙනුවට

**සැලකිය යුතුයි.**

- ➢ **ඔබ සහ ඔබ සමඟ පැමිණෙන අමුත්තන් විසින් කැමරා සහ ජංගම දුරකථන යනාදිය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුළට රැගෙන යාම ආරක්ෂක හේතූන් මත තහනම් කර ඇති බැවින්, ඒවා රැගෙන ඒමෙන් වැළකිය යුතුය.**